රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - **2018/2019** අධ්‍යයන වර්ෂය

දෙවන සමාසික අවසාන පරීක්ෂණය - 2021 නොවැම්බර්

**MAE 5202** - මූල්‍ය ආර්ථික විද්‍යාව

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. එක් කොටසකින් ප්‍රශ්න දෙක **(02)** බැගින් තෝරාගෙන ප්‍රශ්න <u>හතරකට **(04)**</u> පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03 යි.

---

<u>I කොටස</u>

(01).

I. පහත වගුවේ දෙවන තීරුව සහ අවසාන තීරුව ප්‍රස්තාර ගත කරන්න. ඔබ විසින් නිර්මාණය කරන ලද ප්‍රස්තාරයට දිය හැකි නම කුමක්ද? (ලකුණු 05)

| **2021** අගෝස්තු මස **04** වෙනිදා ගෙන් අවසන් වූ සතිය සඳහා රාජ්‍ය සුරකුම්පත් - ප්‍රාථමික සහ ද්විතියික වෙළෙඳපොළේ ඵලදා අනුපාතික | | | | |
|---|---|---|---|---|
| සුරකුම්පත් | කල් පිරීමේ කාලය | ඵලදා අනුපාතික | | |
| | | මිල දී ගැනීම | විකිණීම | සාමාන්‍යය |
| භාණ්ඩාගාර බිල්පත් | දවස් **91** | **5.21** | **5.11** | **5.16** |
| | දවස් **182** | **5.23** | **5.14** | **5.19** |
| | දවස් **364** | **5.29** | **5.19** | **5.24** |
| භාණ්ඩාගාර බැඳුම්කර | අවුරුදු 2ට වැඩි | **6.10** | **5.99** | **6.04** |
| | අවුරුදු 3ට වැඩි | **6.74** | **6.62** | **6.68** |
| | අවුරුදු 4 ට වැඩියි | **7.27** | **7.11** | **7.19** |
| | අවුරුදු 5 ට වැඩි | **7.48** | **7.35** | **7.42** |
| | අවුරුදු ට වැඩි | **7.78** | **7.59** | **7.68** |
| | අවුරුදු 8ට වැඩි | **8.25** | **8.11** | **8.18** |
| | අවුරුදු 10ට වැඩි | **8.73** | **8.55** | **8.64** |
| | අවුරුදු 15ට වැඩි | **8.95** | **8.78** | **8.86** |
| | අවුරුදු 20 ට වැඩි | **8.98** | **8.77** | **8.87** |
| | අවුරුදු 30ට වැඩි | **8.94** | **8.80** | **8.87** |

II. ඉහත ඔබ විසින් නිර්මාණය කළ ප්‍රස්තාරයේ වමේ සිට දකුණට ඉහළට බෑවුම් වීමට හේතුව
   a. ද්‍රවශීලතා වරණ න්‍යාය සහ
   b. වෙළෙඳපොළ විභේදන න්‍යාය ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(02).

I. පහත දැක්වෙන්නේ කිරි පිටි නිෂ්පාදන සමාගමක් වන ඇවුරෝ සමාගමේ ලාභ අලාභ ගිණුම සහ ශේෂ පත්‍රයයි. ඒවායේ සඳහන් තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් දෙන ලද වර්ෂ දෙක සඳහා පහත සඳහන් අනුපාත ගණනය කොට කාලයත් සමඟ ඒවායෙහි වෙනස් වීම විග්‍රහ කරන්න. (ලකුණු 12)

   a. ජංගම අනුපාතය (Current ratio)
   b. ක්ෂණික වත්කම් අනුපාතය (Quick ratio)
   c. තොග සහ සංසරණ අනුපාතය (Inventory turnover ratio)
   d. මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය (Total asset turnover ratio)
   e. පොලී ආවරණ අනුපාතය (Interest cover ratio)
   f. හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (Return on equity ratio)

| ලාභ අලාභ ගිණුම | **2019** (රුපියල් මිලියන) | **2020** (රුපියල් මිලියන) | ශේෂ පත්‍රය | **2019** (රුපියල් මිලියන) | **2020** (රුපියල් මිලියන) |
|---|---|---|---|---|---|
| විකුණුම් | 750 | 700 | මුදල් | 10 | 20 |
| විකුණුම් පිරිවැය | 600 | 560 | ණය ගැතියෝ | 90 | 80 |
| දළ ලාභ | 150 | 140 | තොග | 135 | 101 |
| ස්ථාවර වියදම් | (55) | (50) | මුළු ජංගම වත්කම් | 235 | 201 |
| ක්ෂය වීම් | (30) | (24) | දළ ස්ථාවර වත්කම් | 345 | 300 |
| බදු සහ පොලී ගෙවීමට පෙර ඉපයුම් | 65 | 66 | සමුච්චිත ක්ෂය වීම් | (155) | (125) |
| පොලී | 20 | 18 | මුළු ස්ථාවර වත්කම් | 190 | 175 |
| බදු වලට පෙර ඉපයීම | 45 | 48 | මුළු වත්කම් | 425 | 376 |
| බදු | 18 | 19 | | | |
| ශුද්ධ ලාභ | 27 | 29 | ජංගම වගකීම් | 65 | 53 |
| ගෙවූ ලාභාංශ | 14 | 13 | දිගු කාලීන බැඳුම්කර | 152 | 128 |
| රඳවා ගත් ලාභ | 13 | 16 | සාමාන්‍ය කොටස් | 65 | 65 |
| | | | රඳවා ගත් ලාභ | 143 | 130 |
| | | | මුළු වගකීම් සහ ප්‍රාග්ධනය | 425 | 376 |

II. තීරණ ගැනීමේ උපකරණයක් ලෙස අනුපාත විශ්ලේෂණයෙහි ඇති සීමාකම් සාකච්ඡා කරන්න. (ලකුණු 03)

(03).

I. වරණීය කොටස් හා සාමාන්‍ය කොටස් අතර වෙනස සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. කොටස් වෙළෙඳාම සම්බන්ධව යෙදෙන පහත සඳහන් යෙදුම් අර්ථ දක්වන්න.

a. ප්‍රාථමික කොටස් නිකුතුව සහ පුද්ගලික නිකුතුව
b. මධ්‍යම තැන්පතු ක්‍රමය
c. හිමිකම් නිකුතුව සහ ප්‍රසාද නිකුතුව

(ලකුණු 06)

III. කොළඹ කොටස් හුවමාරුව මත කොවිඩ්-19 මගින් ඇති කළ බලපෑම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

## II කොටස

(04).

I. කාර්යාත්මක ප්‍රවේශය හා ව්‍යුහාත්මක ප්‍රවේශය ආශ්‍රයෙන් මූල්‍ය පද්ධතිය අර්ථ දක්වන්න. (ලකුණු 03)

II. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ ප්‍රධාන අංග හඳුනා ගෙන ඒ පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 04)

III. ඒවායේ විවිධ ලක්ෂණ පදනම්ව මූල්‍ය වෙළෙඳපොළවල් වර්ගීකරණය කරන්න. (ලකුණු 04)

IV. මූල්‍ය වත්කම් වල ප්‍රධාන ගුණාංග සංක්ෂිප්තව දක්වන්න. (ලකුණු 04)

(05).

I. ආර්ථිකයක ගණුදෙනු කරනු ලබන හිඟ ඒකක සහ අතිරික්ත ඒකක වල ගැටෙන සුළු අරමුණු ලේඛණගත කොට ඒ පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 04)

II. ආර්ථිකයක මූල්‍ය අතරමැදියන් විසින් පැහැර හැරීමේ අවදානම් අවම කර ගනු ලබන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 03)

III. මූල්‍ය අතරමැදිකරණ ක්‍රියාවලියේ සීමාකම් අවධාරණය කරමින් මූල්‍ය අතරමැදිකරණ ක්‍රියාවලිය රූප සටහනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04)

IV. මූල්‍ය අතරමැදියන් විසින් සමස්ත සමාජය විෂයෙහි ප්‍රතිලාභ අත්කර දෙනු ලබන්නේ කවර ආකාරයෙන් ද යන්න විග්‍රහ කරන්න.

(ලකුණු 04)

(06).

I. ඔබගේ සහෝදරියගෙන් රුපියල් 1000 ඔබ ණයට ගැනීම සහ ඇය ඒ සඳහා රුපියල් 1200 ක් ඊළඟ වසරේදී අපේක්ෂා කරනු ලබන්නේ නම් වර්තමාන වටිනාකම් සමීකරණ ඇසුරෙන් ඉහත ණය මුදලෙහි පරිණතියට එළදාවේ වටිනාකම (පොලී අනුපාතිකය) ගණනය කරන්න.

(ලකුණු 02)

II. බැඳුම්කරවල මිල සහ එළදාව වෙළඳපොළ පොලී අනුපාතිකය අතර සම්බන්ධතාවය කවරක්ද යන්න සිරස් අක්ෂයෙහි මිල සහ තිරස් අක්ෂයෙහි එළදාව නිරූපණය වන පරිදි රූප සටහනක් අඳින්න.

(ලකුණු 04)

III. විවිධ වෙළඳපොළ පොලී අනුපාතික යටතේ කෙටිකාලීනස හ දිගුකාලීන බැඳුම්කර අතර සම්බන්ධතාව ප්‍රස්තාරිකව නිරූපණය කොට විස්තර කරන්න.

(ලකුණු 03)

IV. කරුණාරත්න සමාගම රුපියල් 1000 ක සම අගයක් සහා වාර්ෂික පරිණත කාලයක් සහිත බැඳුම්කරයක් වෙළඳපොළට නිකුත් කර ඇත. ආයෝජකයෝ ඉහත බැඳුම්කරය මත 8% ක ප්‍රතිලාභ අනුපාතිකයක් අපේක්ෂා කරති. මෙම බැඳුම්කරය සඳහා වාර්ෂිකව 10% ක කූපන් අනුපාතිකයක් ගෙවීමට සමාගම සැලසුම් කර ඇත.

a. ඔබ මෙම බැඳුම්කරය මිළදී ගැනීමට කැමැත්තෙන් සිටින්නේ නම් මෙම බැඳුම්කර සඳහා ඔබ ගෙවීමට බලාපොරොත්තු වන උපරිම මිල ගණනය කරන්න.

(ලකුණු 02)

b. ආයෝජකයින්ගේ අවශ්‍ය කරන ප්‍රතිලාභ අනුපාතිකය වාර්ෂිකව 12% ක් නම් ඉහත බැඳුම්කරයේ වටිනාකම කොපමණ ද?

(ලකුණු 02)

V. රුපියල් 100 ක සම අගයක් සහිත රෝයල් සමාගමේ වරණීය කොටස් මිළදී ගැනීමට ඔබ කල්පනා කරමින් සිටී. මෙම කොටස් සඳහා 15% ක ලාභාංශ අපරිමිතව ගෙවීම් කරනු ලබයි. මෙම කොටස් සඳහා 12% ක ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිටියේ නම් ඔබ මෙම වරණීය කොටස් සඳහා කවර මිලක් ගෙවිය යුතු ද?

(ලකුණු 02)

@@@@@@@@@